ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
Uva Provincial Department of Education

# සමාජ විද්‍යා තරගාවලිය - 2023

| 7 ශ්‍රේණිය | කලාප මට්ටම | කාලය: පැය 1 මි.15 යි. |
|---|---|---|

ශිෂ්‍ය/ශිෂ්‍යාවගේ නම : ..........................................................................................

පාසලේ නම : .................................................................................. පාසල් කාණ්ඩය : ................

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

- ප්‍රශ්න අංක 01 සිට 10 දක්වා ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතුරින් වඩාත් ම පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. පිළිස්සූ මැටි ගඩොල් භාවිතා කර නිවාස සැදූයේ කුමන ශිෂ්ටාචාරවල වැසියන් ද?
   1. ඉන්දු නිම්න වැසියන්
   2. යුප්‍රටීස් ටයිග්‍රිස් නිම්න වල වැසියන්
   3. ඊජිප්තු ශිෂ්ටාචාරයේ වැසියන්
   4. හොවැංහෝ ශිෂ්ටාචාරයේ වැසියන්

02. ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට ඉදි කළ වැව වර්තමානයේ හඳුන්වනු ලබන්නේ,
   1. තිසා වැව
   2. මින්නේරිය වැව
   3. බසවක්කුලම වැව
   4. මහවිලච්චිය

03. ඔබේ පාසලේ ඉතිහාසය සොයා ගැනීමට උපකාරි වන ලිඛිත මූලාශ්‍රයක් වන්නේ,
   1. ආදි ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගෙන් ලබාගත හැකි තොරතුරු
   2. පාසලේ තබා ඇති පැරණි ඡායාරූප
   3. පාසලේ පවත්වාගෙන යන ලොග් සටහන් පොත
   4. වර්තමානයේ සිසුන් ඇතුළත් කිරීමේ ලේඛන

04. ජීව විද්‍යාත්මකව පුද්ගලයෙකුගේ අනන්‍යතාව සුවිශේෂී ව හඳුනා ගැනීම සඳහා භාවිතා කරනු ලබන්නේ,
   1. නහයේ හැඩය
   2. අත්ලේ සලකුණු මත
   2. බාහිර පෙනුමෙන්
   4. DNA පිළිබඳ පරීක්ෂණ මගින්

05. පාරිභෝගිකයෙකු වශයෙන් අඩුම මිලට ගුණාත්මක බවෙන් යුත් උසස් භාණ්ඩ මිලදී ගැනීමට නම් ඔබ තුළ තිබිය යුත්තේ,
   1. භාණ්ඩ වල හිඟතාවය පිළිබඳ දැනුම.
   2. අපේක්ෂා කරන භාණ්ඩවල මිල ගණන් පිළිබඳ අවබෝධය.
   3. සැපයුම පිළිබඳ දැනුම.
   4. භාණ්ඩ වල ඉල්ලුමේ ප්‍රමාණය පිළිබඳ අවබෝධය.

06. පාසලේ සංවර්ධන කමිටුවේ සාමාජිකයෙකු නොවන්නේ,
   1. දෙමාපිය නියෝජිතයන්
   2. ආදිශිෂ්‍ය සංගමයේ නියෝජිතයන්
   3. කලාප අධ්‍යාපන කාර්යාලයේ නිලධාරියෙකු
   4. ශිෂ්‍ය නායක මණ්ඩලයේ නියෝජිතයෙකු

07. අතීතයේ වෙළඳාම දියුණු වීමත් සමඟ බිහි වූ වෙළඳ නගරයක් වන්නේ මින් කුමක් ද?
   1. මාගම
   2. මන්නාරම
   3. පොළොන්නරුව
   4. යාපහුව



CamScanner

08. රටවල් අභ්‍යන්තරයේ පිහිටි මුහුදක් වනුයේ,
1. කළු මුහුද 2. කැස්පියන් මුහුද 3. රතු මුහුද 4. මධ්‍යධරණී මුහුද

09. පෘථිවි ගෝලයේ සමකයේ විෂ්කම්භය වනුයේ,
1. 12714 km 2. 40077 km 3. 39943 km 4. 12757 km

10. තම දුර්වලතා අවම කර ගැනීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියා මාර්ගයක් නොවන්නේ,
1. දුර්වලතා පෙන්වා දුන් විට නිහතමානීව එය පිළිගැනීම.
2. අධිෂ්ඨානයෙන් යුතුව කටයුතු කිරීම.
3. පැත්තකට වී තනිව හඬා පසුතැවිලි වීම.
4. සිදු වූ වැරදි නැවත නොවීමට වග බලා ගැනීම.

(2 x 10 = 20)

- **ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා ඇති ප්‍රකාශ නිවැරදි නම් (✓) ලකුණ ද වැරදි නම් (X) ලකුණ ද ඉදිරියේ ඇති වරහන් තුළ යොදන්න.**

11. විවිධ වර්ණ යොදාගෙන ගල් පර්වත මත චිත්‍ර ඇන්දේ නව ශිලා යුගයේ මිනිසුන් ය. (.......)
12. විස්තෘත පවුල යනු ඥාතීන් සමූහයකින් යුක්ත පරම්පරා තුනක් හෝ ඊට වැඩි ගණනක සාමාජිකයන්ගෙන් සමන්විත පවුල් ඒකකයකි. (.......)
13. දැනට ලැබී ඇති තොරතුරු අනුව වායුව හා ජලය පවතින ජීවීන්ට හිතකර පරිසරයක් ඇති එකම ග්‍රහලෝකය පෘථිවියයි. (.......)
14. අක්ෂාංශ හා දේශාංශ පදනම් කරගෙන රටක පිහිටීම දැක්වීම සාපේක්ෂ පිහිටීම ලෙස හැඳින්වේ. (.......)
15. නගරයක් අසල පළමු වරට වැවක් ඉදි කළේ දේවානම්පියතිස්ස රජතුමා ය. (.......)

(2 x 5 = 10)

- **ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ඇති ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර යොදා හිස්තැන් පුරවන්න.**

16. ලෝකයේ පැරණිතම ගොවිතැන් ක්‍රමය වනුයේ .......................................... යි.
17. ඔබගේ මවගේ අයියාගේ බිරිඳ ඔබගේ .............................................. වේ.
18. පෘථිවිය තම අක්ෂය වටා ගමන් කිරීම .............................................. වේ.
19. තෝනිගල සෙල්ලිපියේ මහ කන්නය හඳුන්වා ඇත්තේ .......................................... නමිනි.
20. ඔබගේ උසස් ගතිගුණ හැසිරීම රටා සුවිශේෂී හැකියාවන් පිළිබඳ ඇති කර ගන්නා අභිමානය ................................................ වේ.

(2 x 5 = 10)

- **ප්‍රශ්න අංක 21 සිට 25 තෙක් දී ඇති පින්තූර ආශ්‍රිතව කෙටි පිළිතුරු ලියන්න.**

21.



I. මෙම රූපයෙන් දැක්වෙන්නේ කුමක් ද?

..........................................................................

II. මෙම භාණ්ඩය ආනයනය කළේ කුමන රටකින් ද?

..........................................................................



CamScanner

22. 

I. මෙම රූපයෙන් පිළිබිඹුවන අවස්ථාව කුමක් ද?

..............................................................................................

II. මෙම කාලයේ මෙරට පාලනය කළ රජතුමා කවුද?

..............................................................................................

23. 

I. මෙම උපකරණය හඳුන්වන නම කුමක් ද?

..............................................................................................

II. මෙය යොදාගනු ලබන්නේ කුමන කර්මාන්තයක් සඳහාද?

..............................................................................................

24. 

I. මෙම රූපය හඳුනාගෙන නම් කරන්න.

..............................................................................................

II. මෙය සෑදූ රජතුමා කවුද?

..............................................................................................

25. 

I. මෙම රූපය හඳුනාගෙන නම් කරන්න.

..............................................................................................

II. මෙය උපයෝගී කරගෙන මනින ලද මිනුම් ඒකකය කුමක් ද?

..............................................................................................

(4 x 5 = 20)

- **ප්‍රශ්න අංක 26 සිට 30 දක්වා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.**

26. පවුලේ සාමාජිකයෙකු වශයෙන් ඔබ තුළ වර්ධනය කර ගත යුතු ගුණාංග 2 ක් ලියන්න.

I. ..............................................................................................

II. ..............................................................................................

27. පහත සඳහන් වර්ෂ බුද්ධ වර්ෂ වලින් ලියන්න.

I. 1948 - ..................................... II. 2023 - .....................................

28. බදුලු ටැම් ලිපියේ දැක්වෙන වෙළඳපොළ පාලනයට අදාළ නීති දෙකක් ලියා දක්වන්න.

I. ..............................................................................................

II. ..............................................................................................



CamScanner

29. ශ්‍රී ලංකාව හැරුණු විට ඉන්දියන් සාගරය තුළ පිහිටා ඇති දූපත් දෙකක් නම් කරන්න.

I. ..............................................................................................................

II. ..............................................................................................................

30. සක්‍රියව සවන්දීමෙන් අපට ලැබෙන වාසි 2 ක් ලියන්න.

I. ..............................................................................................................

II. .............................................................................................................. (5 x 5 = 25)

- ප්‍රශ්න අංක 31 සිට 35 දක්වා දී ඇති ස්ථාන සපයා ඇති ශ්‍රී ලංකා සිතියමේ ලකුණු කර නම් කරන්න.


31. කොළඹ

32. පේදුරු තුඩුව

33. තලෙයිමන්නාරම

34. කතරගම

35. කෝනේශ්වරම් කෝවිල



(3 x 5 = 15)

# LOL.lk
## BookStore



# විභාග ඉලක්ක
# පහසුවෙන් ජයගන්න

ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න



| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට

**www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න**